**ඉන්දියාවේ ඉංග්‍රීසි අනුකාරක ඉන්දියානුන්ගෙන් සමන්විත පිරිසක් ගොඩනැගීමේ අවශ්‍යතාව මැකෝලේ සාමිවරයා අවධාරණය කළේය. දේශීය භාෂා වෙනුවට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමෙන් එය කළ හැකි බව ඔහු කීය. එවිට ඒ පිරිස හමෙන්, ශරීර පැහැයෙන් හා ලේ වලින් ඉන්දියානුවන් වන නමුත් ඇතුළතින් සුදු මානසිකත්වයකින් යුතු ඉංග්‍රීසි සිරිත් විරිත් අනුගමනය කරන වහල් අනුකාරක පිරිසක් වනු ඇති බව ද මැකෝලේ පෙන්නා දුන්නේය. බ්‍රිතාන්‍ය ගැති කලු සුද්දන්ගේ සමාජයක් ඉන්දියාවේත් ලංකාවේත් බිහිවූයේ ඒ විදියට ය.**

වටිනා භාෂාව ලෙස නම් කෙරිණ. ඉංග්‍රීසි මිළ අධික භාෂාවක් ලෙස සැලකුණු අතර එය ඉගෙන ගන්නට හැකිවූයේ ඉංග්‍රීසි මාධ්‍යය තිබූ උසස් පාසැල්වලට ඇතුල් වන්නට හැකිවූ ධනවත් ඉන්දියානුවන්ට පමණය. ඒ පාසැල් පාලනය වූයේ ක්‍රිස්තියානි මිෂනාරීන් යටතේය. ඉංග්‍රී භාෂාවට අමතරව බටහිර සිරිත් විරිත් හා මතද එහි අධ්‍යාපනය ලද අයට ලැබිණ. මෙම පාසැල් වලින් බිහිවූයේ ඉංග්‍රීසි ක්‍රමය වැළඳගත් බටහිර අනුකාරක, දේශීය දේ හෙළාදකින ඉන්දියානුන් පිරිසකි. මැකෝලේ සිතූ පරිදිම මේ පිරිස සමේ පැහැයෙන් පමණක් ඉන්දියානුන් වූහ. අනෙක් සියළු අතින් බ්‍රිතාන්‍ය ගැති පිරිසක් වූහ. එසේම බ්‍රිතාන්‍ය රාජ්‍ය වර ප්‍රසාද ද නොඅඩුව ලැබුණු නිසා ඔව්හු සෙසු දේශීය ඉන්දියානුන්ට වඩා බලවත් පිරිසක් වූහ. ඔවුන් හැඳින් වුණේ "දුඹුරු මහත්වරු" (Brown Sahibs) යන නමිනි. ඉන්දියානු නිදහස් සටන පැවති කාලයේ මේ අයට ඉන්දියාව තුළ අපහාසාත්මක නමක් පටබැඳුණි. එනම් "මැකෝලේගේ අවජාතක දරුවෝ" යන්නය. ඔවුන්ගේ සිතුවිළි හා මානසිකත්වය මැකෝලියානු මානසිකත්වය වශයෙන් ප්‍රකාශ කෙරිණ.

## මැකෝලේගේ ලංකා දරුවෝ බිහිවූ හැටි !

ඉන්දියාවේ බ්‍රිතාන්‍ය පාලනය වැඩී යත්ම ඊට සමාන්තරව අපේ රට ලංකාවේ ද විශාල වෙනස්කම් ඇතිවන්නට වීය. කෝල්බෲක්, කැමරන් ආදී කොමිසම් වලට අනුව ලංකා පාලන ව්‍යූහයේ නීති පද්ධතියේ සහ අධ්‍යාපනයේ වෙනස්කම් රාශියක් ඇතිවිය. කතෝලික හා ක්‍රිස්තියානි පාලනය යටතේ ඉංග්‍රීසි අධ්‍යාපනය නගරබදව පැතිරීයත්ම මැකෝලි දරුවන් ලංකාවේ ද බෝවී යන්නට පටන්ගත්තේය.

19 වන සියවස අවසාන භාගයේ ඉංග්‍රීසි උගත් ලාංකික කලු සුද්දන් පිරිසක් පරිපාලන ක්ෂෙත්‍රයට එන්නට වූහ. මැකෝලේ සිතූ ලෙසම මෙම කලු සුද්දෝ බ්‍රිතාන්‍ය ගැත්තෝ වූහ. උඩරට නිළමෙලා සහ රදළ පරපුරේ අය ද පහත රට මුදලි මුහන්දිරම්ලා ද ඉඩම් හිමියන් ද උතුරේ සහ නැගෙණහිර වෙල්ලාල කුලයේ අය ද ඉංග්‍රීසි අධ්‍යාපනය ලැබ විශේෂ වරප්‍රසාද ලත් පන්තියක් වශයෙන් සැලකුම් ලබන්නට වූහ. කොළඹ ඇතුළු ප්‍රධාන නගරවල වාසය කරමින් ඔවුන් රටේ ස්වකීය සෙසු ජනතාව දෙස බලන්නට වූයේ මහන්තත්වයෙනි. ඉංග්‍රීසි බස නොදත් අය පහළ මට්ටමකට දා අවඥාවෙන් සලකන ලදී. ලංකාවේ උසස් පන්තිය හා පහත් පන්තියක් යනුවෙන් දෙකොටසක් ගොඩ නැගුණේය.

## දේශීයත්වයේ හා සිංහල ජාතිකත්වයේ පිබිදීම

පියදාස සිරිසේන, අනගාරික ධර්මපාල, එස් මහින්ද හිමි, මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ආදී දේශමාමක ගිහි පැවිදි පිරිස්වල මගපෙන් වීම් හා උද්ඝෝෂණ නිසා ශ්‍රීලංකාව තුළ ජාතික පිබිදීම හා ඉංග්‍රීසීන්ගෙන් මිදීම පිළිබඳ හැඟීම් මතුවන්නට වීය. එසේම කර්නල් ඕල්කොට්ගේ උනන්දුකිරීම මත මිෂනාරීන් ගෙන් මිදුණු බෞද්ධ අධ්‍යාපනයක වටිනාකම දැනෙන්නට වීය. උතුරේද හින්දු ජාතිකත්වය නැගීගෙන එමින් දෙමළ ජනතාවටද ස්වභාෂා අධ්‍යාපනය කෙරෙහි උනන්දුවක් ඇතිවෙමින් තිබිණ. මිෂනාරි අධ්‍යාපනයේ ග්‍රහණයෙන් මිදෙන්නට උනන්දුවක් එකල සාමාන්‍ය ලාංකික ජනතාව අතර වැඩී එන්නට වීය.

1930 අවසාන භාගය වනවිට බ්‍රිතාන්‍යයට සිය ආධිපත්‍යය ඉන්දියාවෙන් ගිලිහී යන බව දැනෙන්නට විය. ඉතා ඉක්මනින් ඉවත්වන්නට සිදුවන බව දත්තේය. ශ්‍රීලංකාව ගැනද තත්වය ඔවුනට දැනුණේ එසේය. අපටද ස්වයං පාලන යක් දෙන්නට සිදුවන බව ඉංග්‍රීසීන්ට පෙනිණ. හිරු නොබසින අධිරාජ්‍යයේ හිරු බැස යන බව එකල්හි ඔවුනට වැටහෙන්නට වීය.

ඉතිරි සියල්ල දැන් ඉතිහාසයයි. බ්‍රිතාන්‍යය ඉන්දියාවෙන් ස්ථිරවම ඇත්වී යනවිට ඒ තත්වය අපේ රටට ද ලබා දෙමින් අපෙන් ද ඈත්වුණේය. අපි 1948 දී නිදහස ලැබූයෙමු.

## නිදහසෙන් පසු

නිදහස දෙමින් සුදු පාලකයන් ඉවත්වී ගිය නමුත් ඔවුන්ගේ අතින් ලංකාවේ පාලනය ගියේ මැකෝලේ දරුවන් පිරිසකගේ අතටය. සිවිල් සේවය පරිපාලනය හා නීතිමය අංශය මේ ආදී පාලන තන්ත්‍රයේ ප්‍රධානතම කොටස් සියල්ල පාහේ හැසිරවීම සහ වගකීම මැකෝලේ දරුවෝ බාරගත්හ. ප්‍රතිඵල නොලාගත්තේද ඒ වරප්‍රසාද ලත් පන්තියයි. සියල්ල සිදුවුණේ ඔවුන්ගේ ඕනෑ එපාකම් පරිදි ය.

රජබස ලෙස තිබූ ඉංග්‍රීසිය වෙනස්කර බහුතරයකගේ දේශීය භාෂාවට හරවන්නට 1956 දක්වා වෙහෙසක් ගන්නට සිදුවිය. පාසැල් අධ්‍යාපනය මිෂනාරි ග්‍රහණයෙන් මුදවාගනිමින් තවත් මැකෝලේ දරුවන් එමගින් බෝවනු වැලැක්වීමට 1961 දක්වා බලා ඉන්නට සිදුවීය. එහෙත් නිදහස ලැබී වසර 64 ක් දැනට ගෙවී ඇතත් තවමත් අප අතර බොහෝ මැකෝලේගේ දරුවන් සිටිනු දැකිය හැක.

## මැකෝලේ දරුවන් සහ ජාතික උන්නතිය

මැකෝලේ දරුවන් යටත්විජිත සමයේ රටේ පාලනතන්ත්‍රයට ගැවී කටයුතු කළද නිදහස ලැබීමෙන් පසුවත් පරිපාලන සේවයේ සිටියද දේශීය හා ජාතික දියුණුවට ඔවුන්ගෙන් කිසිදු සේවයක් සිදුව නැත. මෙයට හේතුව ඔවුන් අනුකරණය කරන්නන් මිස නිර්මාණය කරන්නන් නොවීමයි. මැකෝලේ ට අවශ්‍ය වූයේද එවැනි පිරිසක් තැනීමයි. සුද්දන් ඉවත්වී ගියද ඒ සුදු ගැති මානසිකත්වයෙන් මිදී දේශීය ප්‍රවාහයට එක්වන්නට මිශ්‍රවන්නට ඔවුනට නොහැකි ය.

යටත් විජිත යුගයේත් නිදහස ලැබුණු පසුවත් වසර 200 කට වඩා කාලයක් විදේශීය අධ්‍යාපනය යටතේ අප රට බුද්ධිමතුන් බොහෝ බිහිකර ඇතත් ඔවුන් ජාතික වශයෙන් දේශයට ආඩම්බරවිය හැකි සැබෑ ස්වදේශීය දෙයකැයි අගය කළ හැකි කිසිවක් කිසිම අංශයකින් සම්පාදනය කර නැත.

අප රටට නිර්මාණාත්මක ලෙස අගය කළයුතු යමක් ප්‍රදානය කළ අය වෙතොත් ඔව්හු මැකෝලි දරුවෝ නොවෙති. ඉන්දියාවේ වුවද උසස් කීර්තිමත් නාමයක් උසුලන රවීන්ද්‍රනාත් තාගෝර් හා රවී ශංකර් වැනි අය මැකෝලි දරුවෝ නොවන්නාහ. මේ බලන්න!

අනගාරික ධර්මපාල, පියදාස සිරිසේන, මහාචාර්ය සෙනරත් පරණවිතාන, ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර, මාර්ටින් වික්‍රම සිංහ, එදිරිවීර සරච්චන්ද්‍ර, සෝලියස් මැන්දිස්, වෛද්‍ය වික්‍රමාරච්චි, කුමාරතුංග මුනිදාස, රැපියෙල් තෙන්නකෝන්, විශාරද අමරදේව, සුනිල් සාන්ත, අරිසෙන් අහුබුදු, හෙන්රි ජයසේන, අල්විස් පෙරේරා, කෝයස්, ආරුමුගම් නාවලර් ආදී මේ කිසිවෙකු අතර මැකෝලේ තැනූ දරුවෙකු නැත. එසේම අප රටේ භාෂාවට හා ආගමට විශාල මෙහෙයක් ඉටුකළ විශාරද දැනුමෙන් යුත් සංඝ පීත්‍ය පඬිවරුන් රාශියක්ද විසූහ.

ලාංකිකයෙකු වුවද සම්පූර්ණයෙන්ම එංගලන්තයේ අධ්‍යාපනය ලැබූ ආනන්ද කුමාරස්වාමි අප රටේ දේ අගයකරමින් සාහිත්‍ය සහ කලා විචාරකයෙකු වශයෙන්ද දාර්ශනිකයෙකු ලෙස ද ප්‍රාමාණික මෙහෙයක් කළේ ඔහු මැකෝලේ දරුවෙකු නොවන නිසාය.

**Ilford Essex UK**

# Macaulay's children

From India, Lord Macaulay sent a detailed message to British Parliament in 1935 outlining a plan for promoting English education in India and laying the foundations for the subjugation of the native people in preparation for future colonial domination of India

He called for "creating a class of Anglicised Indians who would serve as cultural intermediaries (tholkayas) between the British and the Indians. That this group, while being Indians in skin colour and blood would be White or English in likes and dislikes, manners and ideas, values, attitudes and mentality inside." It served as the base for the policy of education adapted by the English in Colonial India and Ceylon subsequently.

It was based on promoting this view of Education encouraged by the colonial governments, that the Christian and Catholic Missionaries established their school system. They added another factor to it. That was to promote conversion of natives to Christianity.

With the developments of the British Colonial Government in India, English became the official language and became the valued language. Being costly, English education was limited to the rich who could pay the fees in English medium schools, mostly run by Missionaries who monopolised education. These produced a class of **Anglicised Gentlemen** who were, as Macaulay wanted " Indian in skin colour and blood but Englishmen in all other aspects."

They became powerful because they were favoured by the British rulers, served as their lackeys and became the " **Indian Sahibs** " Ultimately with Independence they became the new Ruling Class. These were the group of people who began to be called derogetorily during the independence struggle in India as "Macaulay's Children " Their mentality began to be referred to as " Macaulayism"

In similar circumstances Macaulay's children started breeding all over Sri Lanka (Ceylon) too. By the turn of the 19th Century a class of anglisized ruling black-Englishmen (**kalu suddo**) had been established who had received their English education in those schools which had been created along the lines proposed by Macaulay. Our Macaulays children had been selected from the Nilames and aristocratic families in the upcountry, the Mudali, Muhandiram families in the low country and the high caste Vellala families in the Northern and Eastern areas. All these had been lackeys of white British rulers who had endowed them with power at various levels.

♦ **Wakula Gunapala**
*Ilford Essex UK*

# I Support You - Trust

**ව**සර සතරකට පෙර දිවංගත රන්ජිත් පළන්සූරිය ශූරීන්ගේ සංකල්පනාවක් අනුව ආරම්භ කරන ලද **I Support You Trust** නම් සරණ සේවාව ශ්‍රීලංකාවේ සහන අවශ්‍ය පාසැල් ළමුන්, පවුල් සහ පුද්ගලයන් සොයා බලා ඔවුනට උපකාර කිරීමේ මහඟු කර්තව්‍යයේ යෙදෙයි.

උපකාර අවශ්‍ය පාසැල් ළමුන්ගේ මූලික අවශ්‍යතාවන් සොයා බලා ඔවුනට පොත්පත්, සපත්තු, ඇඳුම් පැළඳුම් සපයාදීමද, දුගී දුප්පත් පවුල් සඳහා ආහාර ද්‍රව්‍ය සපයාදීම මෙන්ම මුදල්මය වශයෙන් ආධාර කිරීමද මේ සේවාව මගින් මේ වසරේ නොකඩවා සිදුකෙරුණි.

තවද වෛද්‍යවරුන් විසින් නියම කරන ලද බෙහෙත් ගැනීමට අපහසු රෝගීන්හට මුදලින් ආධාර කිරීම ද සිදුවිය.

මෙම වසර අවසානයේ ශ්‍රීලංකාවේ ප්‍රදේශ කීපයකම නොමිළයේ වෛද්‍ය සායනයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇති අතර ඒ සඳහා වෛද්‍යවරුන්, හෙදියන්, සෞඛ්‍ය සේවකයන් හා ස්වේච්ඡා සේවක කණ්ඩායමක් සූදානමින් සිටිති.

ශ්‍රීලංකාවේ මේ සඳහා කැපවුණු ස්වේච්ඡා මණ්ඩලයක් මගින් පවුල් තේරීම, මුදල් වැයකිරීම දැඩි පරීක්ෂාවෙන් යුතුව කරන බවත් එසේ තෝරාගන්නා දුප්පත් අසරණ පවුල් වෙනුවෙන්ම පමණක් ඉතා සුදුසු අන්දමින් ඔබේ මුදල් යොදවන බවත් මෙම සේවාව සහතික කරයි.

මේ මහඟු කාර්යය සඳහා ඔබටත් සුළුවෙන් හෝ දායක විය හැකි නම් එය මහත් පුණ්‍ය කර්මයකි.

**වෙබ් අඩවිය : www. isupportyoutrust.org**
**දුරකතනය : 44(0) 1753521271**

